# ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විඩා නිමාගත් ස්ථානයක්වන පෙතන්ගොඩ කටු උණ පඳුර

එම්.ඩබ්.එල් කරුණාරත්න[1], ඩබ්.අයි.පී කුමාරි[2], ඩබ්ලිව්.ඒ.ඒ.ජී රාජපක්ෂ[3]

උඩරට රාජ්‍ය නාමාවලිය තුළ ටිකිරි බංඩාර හෙවත් පළමු වැනි රාජසිංහ රජුට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. ඔහු පිළිබඳව ඓතිහාසික තොරතුරු රාශියක් කෑගල්ල දිස්ත්‍රික්කය තුළින් හමුවේ. ඒ අතරින් පෙතන්ගොඩ ග්‍රාමයටත් එහි පිහිටි රජුගේ මංගල උයන වන කටුඋණ පඳුරටත් හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. අවිස්සාවේල්ල මාර්ගයේ කන්නන්තොට නව පාලමෙන් එගොඩට කෙටි දුරක් ගිය විට මෙම පෙතන්ගොඩ උයන පුරාවිද්‍යා රක්ෂිතයට ළඟාවිය හැකි අතර එහි දුර්ලබ වූ කටුඋණ වර්ගයකින් යුත් පඳුරු දක්නට ලැබේ. වර්තමානය වන විට මෙම පුරාවිද්‍යා උරුමය විනාශයට පත්ව යමින් තිබීම ගැටලුවකි. ඒ පිළිබඳව අධ්‍යයනය කර එහි වටිනාකම අනාවරණය කිරීම අරමුණ වන අතර ඒ සඳහා ක්ෂේත්‍ර ගවේෂණය මෙන්ම ක්ෂේත්‍ර නොවන ගවේෂණය ද යොදා ගන්නා ලදී. මේ උයන රාජසිංහ රජුගේ සමයෙහි රජු සීතාවකට එනවිට විඩා නිවා ගැනීමට මෙම ස්ථානයට පැමිණි බව කියවේ. "රුසිරු පෙතන්ගොඩ උයනට වැඩියාය, නපුරු උණ කටුව පතුලේ ඇනුණාය" පරංගි සමඟ සටන කළ ටිකිරි කුමරු විමලධර්මසූරිය රජු සමඟ ද සටනින් පැරද මෙම උයනට පැමිණි අවස්ථාවේ, ජනශ්‍රැතියේ සඳහන් උක්ත ගීතයේ අයුරින් එම පඳුරෙහි විෂ උණ කටුවක් ඇනුණ බවත්, රජු එහිදී මියගිය බව පොදුමතය වන අතර එය එච්.ඩබ් කොඩිරිංග්මන්, එස්.ජී.පෙරේරා, පෝල්.ඊ පීරිස් වැනි ඉතිහාසඥයෝ ද පිළිගනිති. තවද මෙම ශාකය විෂ නොමැති බවත් රාජසූරිය විවාහ කිරීමට අදහස් කළ දොඩම්පේ ගණිතයාගේ දියණිය රජු විවාහ කර ගත්තායැයි උරණ වූ දොඩම්පේ ගණිතයා හා රාජසූරිය කුමාරයා රජුගේ තුවාලයටත් කටුවටත් විෂ බඳවා රජු මරණයට පත්කළ බව ද කියවේ. එම නිසා මෙම ශාකය විෂ ශාකයක් ලෙස සලකන බවත් කියවේ. තව ද එය කඩා කපා විනාශ කළහොත් සුදු පැහැති නයි මතු වන බව ග්‍රාමීය මතයයි. එම නිසා රජු නයෙක් දෂ්ඨ කර මිය ගිය බවත් ජනප්‍රවාදයේ එයි. එම නිසා මෙම කටු උණ විශේෂය සමහරෙක් විෂ කටු සහිත ශාකයක් ලෙස සලකන අතර රජුගේ දියණියගෙන් වූ සිදුවීමක් මත රජු මරණයට පත් වූ බව ද කියවේ. මේ අනුව රජුගේ මඟුල් උයන මෙලෙස රජුගේ ගිමන් විඩාවට මෙන්ම මරණයටත් හේතුවක් වූ ස්ථානයක් ලෙසට ද ප්‍රසිද්ධ වූ ඓතිහාසික ස්ථානයක් ලෙසට මනාව පැහැදිලි වේ. ඊට තරමක් නුදුරින් පිහිටි ගම ඉහළ පැන් පහසුවට ගත් වංගෙඩි මෝල් ඇල්ල ද වැදගත්කමක් දක්වුව ද මෙය එතරම් ප්‍රචලිත නොවේ. නමුත් උයන නරඹන්නට එන්නන් රාජසිංහ රජු මෙන්ම රජුගේ මරණය මෙතනදී අමතක නොකරයි. වියනක් ලෙසින් සිහින් පත්‍රවලින් දිග කටුවලින් සමන්විත උණ පඳුරු අද විනාශයට පත්ව ඇති අතර කුඩා පැල කිහිපයක් දැනට දක්නට ඇත. විනාශ වෙමින් පවතින මෙම උරුමය තුළ විශාල ඓතිහාසික තොරතුරු රාශියක් ගැබ්ව පවතී.

**ප්‍රමුඛ පද** : පෙතන්ගොඩ උයන, කටු උණ, පළමු වැනි රාජසිංහ රජු, විෂ

[1] ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.priyadarshanii.inforgate@gmail.com

[2] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. waruni1995lasanthika@gmail.com

[3] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.waavishkarajapaksha@gmail.com